**ඇමුණුම - 01- A**

| කාර්යාල ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ගිවිසුම්පත් අංකය | |

**රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා පුහුණුලාභියා අතර එළඹෙනු ලබන ගිවිසුම**

මෙහි පළමු පාර්ශවය යයි කියනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික ජනරජයේ 2017 අංක 02 දරණ පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ දිවිනැගුම පනත මගින් ස්ථාපිත කරන ලද 4 වන මහල, සෙත්සිරිපාය ,බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ................................දිස්ත්‍රික්කයෙහි ...........................ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන සමෘද්ධි කළමනාකරු /වෙනත් නිළධාරියකු එක් පාර්ශවයකට ද,

දෙවන පාර්ශවය යැයි කියනු ලබන එම බල ප්‍රදේශයේ .......................................(ස්ථිර ලිපිනය) හි පදිංචි ජා.හැ.ප. අංක.................................. දරණ (සම්පූර්ණ නම) මයා /මිය/මෙනවිය යන අය හා (මින් මතු පුහුණුලාභියෙකු වශයෙන් හඳුන්වනු ලබන) අනෙක් පාර්ශවයටද බැඳි දෙපාර්ශවයේ එකඟත්වය ඇතිව වර්ෂ 20..........ක් වූ, ....................මස .............වෙනි දින ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

**එකී ගිවිසුමෙහි කොන්දෙසි කවරේද යත්,**

1. ඉහත ගිවිසුම් ප්‍රකාරව වෘත්තීය පුහුණු වැඩසටහන යටතේ රැකියා ඉලක්ක කරගත් වෘත්තිය පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරිම පිණිස හඳුනාගන්නා ලද (පුහුණු පාඨමාලාවේ නම) ............................................ සඳහා එකී පුහුණුලාභියා සුදුසු වන හෙයින් පහත දක්වා ඇති පුහුණුලාභින් සඳහා වන ප්‍රතිපාදන මතු දැක්වෙන කොන්දේසි වලට යටත්ව ඉටුකිරිමට දෙපාර්ශවය එකගවේ.

2. ඉහත ගිවිසුම් ප්‍රකාරව අස්වැසුමලාභී හා අඩුආදායම්ලාභි (සමෘද්ධි සහනාධාර ලැබූ) පවුල් වල ප්‍රජා සවිබලගැන්විමේ වැඩසටහන යටතේ උක්ත වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කිරිම වෙනුවෙන් රුපියල් ............................ක් (රු........................) අද දින පුහුණුලාභියා / පුහුණු ආයතනය ( TVEC විසින් අනුමත) වෙත භාරදුන් බවට දෙපාර්ශවයම එකඟ වේ.

3.ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබා දෙන ලද පාඨමාලා ගාස්තුව වන............................ගෙවිම් කිරිමෙන් අනතුරුව පාඨමාලා අඛණ්ඩව සිදුකර ගෙන යන බවට දෙවන පාර්ශවය එකඟවේ.

4. ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබාගත් මුදල මෙම පුහුණු පාඨමාලාව සඳහා පමණක් නිසි ලෙස යොදා ගනිමින් පාඨමාලාව සාර්ථකව හදාරන බවට දෙවන පාර්ශවය බැඳී සිටි.

5. ඉහත ගිවිසුම් ප්‍රකාරව පුහුණු පාඨමාලාව හැදෑරීමේදී නොසැලකිලිමත් කම නිසා පුහුණු පාඨමාලාවට අඛණ්ඩව සහභාගි නොවිම, පුහුණු පාඨමාලාව සාර්ථකව නිම නොකිරිම ආදිය සිදු වුවහොත් රජය විසින් දරණ ලද මුළු මුදල දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයට ගෙවිමට බැඳි සිටි.

6. ඉහත ගිවිසුම් ප්‍රකාරව ආරම්භ කරන ලද පුහුණු වැඩසටහන යම් සාධාරණ හේතුවක් නිසා අසාර්ථක වුවහොත් වහාම ඒ බව වසමේ සමෘද්ධි සංවර්ධන නිළධාරි හෝ (ව්‍යාපෘති/මුලස්ථාන/කලාප) කළමනාකරු වෙත සිද්ධිය සිදුවි පැය 24 ක් ඇතුලත දැනුවත් කරන බවට දෙවන පාර්ශවය එකඟවේ.

7.ඉහත ගිවිසුම් ප්‍රකාරව පුහුණු පාඨමාලා අධීක්ෂණය හා පසුවිපරම් කිරීම සමෘද්ධි සංවර්ධන නිළධාරියාට,සංවර්ධන නිළධාරියාට ව්‍යාපෘති කළමනාකරුට හා අදාල අනෙකුත් සහාය සේවා සපයන නිළධාරින්ටත් ඇති බව දෙපාර්ශවයම පිළිගනී.

8. මෙම ගිවිසුම අනුව පුහුණු පාඨමාලා සම්බන්ධ ඉහත කොන්දේසි උල්ලංඝනය කිරීමෙන් හෝ කඩකිරීමෙන් මෙම දෙපාර්ශවය අතර ඇතිවන ආරවුල් හෝ ගැටළු සහගත තත්වයකදී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය බව දෙපාර්ශවය පිළිගනී.

මීට සාක්ෂි වශයෙන් පළමු පාර්ශවය සඳහා සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ........................ප්‍රාදේශීය ලේකම් හෝ බලය පවරන ලබන සමෘද්ධි කළමනාකරු/සංවර්ධන නිළධාරි සහ දෙවන පාර්ශවය වෙනුවෙන් පුහුණුලාභියා වර්ෂ...............ක් වූ ...................මස .........වන දින....................................හි දී අත්සන් තබන ලදී.

| පළමු පාර්ශවය | දෙවන පාර්ශවය |
|---|---|
| අත්සන................................ | අත්සන............................... |
| මුලස්ථාන/ව්‍යාපෘති කළමනාකරු | පුහුණුලාභියා............................. |
| (නිල මුද්‍රාව)<br>අංකය................................ | ජා.හැ.ප. |
| දිනය:............................. | දිනය:............................... |

| පළමු පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි | දෙවන පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි |
|---|---|
| 1.අත්සන: | 2. අත්සන: |
| නම: | නම |
| ජ.හැ.ප.අංකය: | ජ.හැ.ප. අංකය: |